## උද්භිද උද්‍යාන භාර අරමුදල - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 16 අනුව සමාලෝචිත වර්ෂයේදී ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කරන ලද බව දක්වා තිබූ අතර, ඒ අනුව යම් වත්කමක් පරිහරණය ආරම්භ කළ දින සිට සමානුපාතිකව ක්ෂය සිදු කළ යුතුයි. එසේ වුවද, අරමුදලට අදාළව වර්ෂය අවසානයේ ප්‍රාග්ධනිත කළ වත්කම් ද ඇතුළුව වර්ෂය තුළ ප්‍රාග්ධනිත කර තිබූ සියලුම වත්කම් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය රු. 7,546,446 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ක්ෂය ගැලපීම නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම් භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ අවස්ථාවේ සිට ක්ෂය කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් යටතේ මල් වගා පොත් හා මාර්ගෝපදේශ පත්‍රිකා විකුණුම් ආදායම ලෙස රු.565,940 ක් ගිණුම්ගත කර තිබුණි. එසේ වුවද, මල් වගා පොත් හා මාර්ගෝපදේශ පත්‍රිකා ලාභාලාභ ගිණුමක් පිළියෙළ කර එම අලාභයද නැවත ආදායමට ගලපා තිබීම හේතුවෙන් මල් වගා පොත් හා මාර්ගෝපදේශ පත්‍රිකා ආදායම ද්විගණනය වී තිබුණි. | "මල් වගා පොත් හා මාර්ගෝපදේශ පත්‍රිකා ආදායම් ද්වි ගණනය වීම" ගිණුම්කරණ සටහන් වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් ද්විගණනය වී ඇති බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හක්ගල උද්භිද උද්‍යානයේ වේන්ලින්ක් වැට ඉදිකිරීමේ පිරිවැය රු. 1,615,373 ක් හා අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ අකුණු සන්නායක පද්ධතියක් ඉදිකිරීමේ පිරිවැය රු.4,142,584 ක ස්ථාවර වත්කම් හා කෙරීගෙන යන වැඩ ගිණුමට දෙවරක් ගැලපීමට කටයුතු කර තිබුණි. | මෙම ද්වි ගණනය වීම නිවැරදි කිරීමට කටයුතු කරමි. | දේපල පිරියත උපකරණ වල වටිනාකම වැඩියෙන් ගිණුම්ගත වී ඇති බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හක්ගල උද්භිද උද්‍යානයේ ආරම්භක වැඩ නිම කිරීම සඳහා රු. 245,247 ක් වැයකර තිබුණි. මෙම ඉදිකිරීම නාය යාමකට භාජනය වී ඇති බැවින් වියදමක් ලෙස කපා නොහැර ප්‍රාග්ධනිත ගත කර තිබුණි. | රු.245,247 ක මුදල වියදමක් ලෙස ගිණුම්ගත නොවීම වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු කරමි. | වියදම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉඩම් සංවර්ධන ක්‍රියාකාරකම් වටිනාකම රු. 5,174,337 ක් ගොඩනැගිලි සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධනිත ගත කිරීම හේතුවෙන් වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු. 170,753 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් පංතීන් වෙන වෙනම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ව්‍යාපෘතිය නිමවී ප්‍රාග්ධනිත කරන ලද ව්‍යාපෘති හතරක් වෙනුවෙන් ගෙවන ලද අත්තිකාරම් රු. 3,562,988 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට මාරු කිරීමට කටයුතු නොකර, අත්තිකාරම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ අඩුපාඩු හඳුනාගෙන එම අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ගොඩනැගිලි සංවර්ධන ක්‍රියාකාරකම් | 210,786,985 | 210,351,124 | 435,861 | මෙම ගිණුම්කරණ සටහන් වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් අතීතානුයෝගීව ක්ෂය ගලපා තිබුණු නමුත් එම වත්කම් මිලදී ගත් දිනයන් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2006 වර්ෂයේ සිට උද්‍යානභාර අරමුදල විසින් එක් එක් වත්කම් මිලදීගත්/භාවිතයට ගත් දිනයන් වෙන් වෙන්ව හඳුනාගෙන එකින් එක වත්කම සඳහා ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම ප්‍රායෝගිකව අපහසු වීම නිසා "වත්කම් මිලදීගත්/පරිහරණය ආරම්භ කළ වර්ෂයේ මුළු වර්ෂය සඳහාම ක්ෂය ගැලපීම සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ දී වත්කම් මිලදී ගත් දින සිට ක්ෂය සිදුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | උද්භිද උද්‍යාන භාර අරමුදලේ විශ්වාසය පලකිරීමේ ඔප්පුව | | | |
| (i) | 3 (එ) (i) වගන්තිය | භාරකාර මණ්ඩලය සෑම කාර්තුවකටම වරක් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පළමු හා තෙවන කාර්තුවේ රැස්වීම් පවත්වා නොතිබූ අතර, දෙවන කාර්තුව තුළ රැස්වීම් වාර දෙකක් පවත්වා තිබුණි. | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ 04 ක් හා අමාත්‍යාංශ ලේකම්වරු කිහිප දෙනෙකු යටතට වරින් වර පත්වීම නිසාත්, දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයද වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ලෙස මාස 07 ක පමණ කාලයක් පැවතීමත් නිසා නියමිත කාල වකවානුවල භාරකාර මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව කාරුණිකව දන්වා සිටිමි. | විශ්වාසය පල කිරීමේ ඔප්පුව ප්‍රකාරව කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 5 (2) (සී)වගන්තිය | උද්භිද උද්‍යානවල සේවය කරන විද්‍යාඥයන්ට තම විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම්, පහසුකම් වැඩි දියුණු කර ගැනීම සඳහා මූල්‍යාධාර සැපයීම හා ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ ඕනෑම ද්‍රව්‍ය මිලදී ගැනීමක් සඳහා එකඟතාවය හිමි වී තිබුණ ද ඊට පටහැනිව සාමාන්‍ය විදේශ පුහුණු වියදම් සඳහා රු. 1,189,585 ක් අරමුදල මඟින් ගෙවා තිබුණි. | උද්භිද උද්‍යාන සංවර්ධනය හා වැඩි දියුණු කිරීමේදී විද්‍යාත්මක දැනුම මෙන්ම කළමණාකරණ, ඉංජිනේරු, ගිණුම් හා විගණන , ප්‍රසම්පාදන සහ පරිපාලන වැනි සෑම ක්ෂේත්‍රයකම දායකත්වය ලබාගැනීමට සිදුවේ. ඒ අනුව 2018 වර්ෂයේ විදේශ පුහුණු වැඩසටහන් 06 ක් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී කරවූ අතර, එයින් පුහුණු වැඩසටහන් 04ක් සෘජුවම විද්‍යාත්මක දැනුම වර්ධනය කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන් වන අතර ඉතිරි වැඩසටහන් දෙක උද්භිද උද්‍යාන සංවර්ධනය හා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍යයැයි හඳුනාගන්නා ලද අනෙකුත් ක්ෂේත්‍රයන්හි දැනුම වැඩි දියුණු කිරීම සඳහා ලබාදුන් පුහුණු වැඩ සටහන් බව කාරුණිකව දන්වා සිටිමි. | විශ්වාසය පල කිරීමේ ඔප්පුව අනුව විද්‍යාඥයන්ගේ දැනුම, කුසලතා හා ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා අරමුදල මඟින් මූල්‍යාධාර සැපයීම සිදු කළ හැකි බව. |
| (ආ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතුයි. එසේ වුවද, විසුරුවා හැරීමට කටයුතු නොකර 2018 සැප්තැම්බර් 17 දින ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අභියාචනාවක් ඉදිරිපත් කර මේ වන විට සාකච්ඡා මට්ටමින් පවතින බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | මෙය ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස ස්ථාපිත කිරීමට හෝ ඇවර කිරීමට කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 119,721,992 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.134,504,011 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,782,019 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් ක්ෂය වියදම රු.40,876,786 කින් ඉහළ යාමත්, මූල්‍ය හා වෙනත් වියදම් රු.3,408,590 කින් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදලේ පරමාර්ථ වශයෙන් ගැනෙන අරමුණු 07 න් එකක් යටතේ ගැනෙන උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් විශේෂිත වූ වැඩ සටහන් සඳහා පුනරාවර්තන අරමුදල් හිඟයන් මෙමඟින් පිරිමසා ගැනීමේ හැකියාව පවතින නමුත්, දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන වියදම්, විශේෂිත වූ පුනරාවර්තන වියදම් ලෙස සලකා සමාලෝචිත වර්ෂයේදී රු.23,690,558 ක මුදලක් අරමුදල මඟින් ගෙවා තිබුණි. | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව අයත් උද්භිද උද්‍යාන දින 365 පුරාම නරඹන්නන් සඳහා විවෘතකර තැබීමට අවශ්‍ය අනුයාත කාර්යාල කටයුතුද උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් සුවිශේෂි කාර්යයන් ලෙස හඳුනාගෙන එම කාර්යයන් අඛණ්ඩව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය භාරකාර මණ්ඩලයට දැන්වීමෙන් පසු ඊට අනුමැතිය ලබාගෙන අදාළ පුනරාවර්තන වියදම් දැරූ බවද කාරුණිකව පෙන්වා දෙමි. | අරමුදලේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේදී විශේෂිත වූ වැඩ සටහන් සඳහා පුනරාවර්ථන අරමුදල් හිඟයන් පිරිමැසීම සිදු කලයුතු අතර වෙනත් පුනරාවර්ථන වියදම් ගෙවීම සිදු නොකළ යුතු බව. |